www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදය යුද අපරාධ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව වෙත නරුම යෝජනාවක් ඉදිරිපත් කරයි

## US makes cynical overture to Sri Lanka over war crimes

**විජේ ඩයස් විසිනි**

**2009 ඔක්තෝබර් 31**

එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව පසු ගිය සතියේ දී, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව ගෙන ගිය යුද්ධයේ අවසන් මාස කිහිපය තුල දී ශ්‍රී ලංකා හමුදාව කල කෲරකම් පිලිබඳව තොරතුරු සපයන පිටු 68ක වාර්තාවක් නිකුත් කලේ ය. එහෙත් එහි අරමුන යුද අපරාධකරුවන් යුක්තිය හමුවට පැමිනවීම නම් නො වේ: කොලඹ පාලනය තුල එක්සත් ජනපදයට පවතින ආනුභාවය වැඩි කර ගැනීම සහ ශ්‍රී ලංකාන්ඩුව සමග පවතින සබඳතා වඩා ශක්තිමත් කර ගැනීම යි.

වාර්තාව සිය නිගමන ඉදිරිපත් කිරීමේ දී පරෙස්සම් සහගත වෙයි. එය වොෂින්ටනයේ දේශපාලන න්‍යාය පත්‍රයෙන් තල්ලුව ලැබූවකි. ඒ කෙසේවෙතත්, එම වාර්තාව ශ්‍රී ලංකා ආන්ඩුවේ යුද අපරාධ පිලිබඳව ආන්ඩුව මහත් අපහසුතාවට පත් කරන ආකාරයේ දෝෂාරෝපනයක් ඉදිරිපත් කරයි. යුද මුක්ත කලාපයක් යැයි මිලිටරිය ප්‍රකාශයට පත් කල එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශවලට හමුදාව ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කල සහ බෝම්බ හෙලූ අවස්ථා 100කට වැඩි ගනනක් එය විස්තර කරයි. වාර්තාව එම ප්‍රහාර නිසා තුවාල ලැබීමට හෝ ජීවිතක්ෂයට පත් වූවන් ගැන කිසිදු සංඛ්‍යාමය තොරතුරක් ලබා නො දෙන මුත් පසු ගිය ජනවාරි මාසයත් ආන්ඩුව සිය ජයග්‍රහනය ප්‍රකාශයට පත් කල මැයි මස මැදත් අතරතුර කාලයේ දී අඩු ගනනේ දෙමල සිවිල් වැසියන් 7,000ක් ඝාතනයට ලක් වූ බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය තක්සේරු කර ඇත.

සවිස්තරාත්මක එකක් ලෙස කියා නොපාන, රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව පදනම් වන්නේ, ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපති කාර්යාලයෙන් ලද අභ්‍යන්තර වාර්තා ද චන්ද්‍රිකා ඡායාරූප ද ජාත්‍යන්තර සහන සේවායතනවලින් සහ ප්‍රවෘත්ති ආයතනවලින් ඉදිරිපත් වූ වාර්තා ද මත ය. ශ්‍රී ලංකා හමුදාව සියලු මාධ්‍යවලටත් ස්වාධීන නිරීක්ෂකයන්ටත් ආධාර ආයතනවලින් බොහොමයකටත් යුද පෙරමුන තහනම් කර තිබින.

ශ්‍රී ලංකාන්ඩුව ගෙතූ මුසාවන්ට පටහැනිව යමින් වාර්තාව මෙසේ සඳහන් කලේ ය: "ශ්‍රී ලංකාන්ඩුව යුද මුක්ත කලාපයට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කල බව හෝ රෝහල් ඉලක්ක කර ගත් බව ප්‍රතික්ෂේප කරමින් සහ සිවිල් වැසියන්ට සිදු වූ කිසිදු හානියකට එය වගකිව යුතු නැති බව සඳහන් කරමින් ජ්‍යෙෂ්ඨ ශ්‍රී ලාංකික නිලධාරීහු යලි යලිත් ප්‍රසිද්ධ ප්‍රකාශ නිකුත් කලහ. කෙසේ වෙතත් යුද මුක්ත කලාපය තුල දී සිදු වූ ෂෙල් වෙඩි ප්‍රහාරවලින් බහුතරය එල්ල වූයේ ශ්‍රී ලංකාන්ඩුවේ හමුදාවලින් බවට තොරතුරු මූලාශ්‍ර චෝදනා කලේ ය."

සිවිල් වැසියන්ට හා සිවිල් ඉලක්කවලට සිදු වූ හානි පිලිබඳව විස්තර කරන වාර්තාවෙන් අඩකට ආසන්න ප්‍රමානයක්, ජනවාරි 2 වන දා සහ හමුදාව වී. ප්‍රභාකරන් ඇතුලු ජ්‍යෙෂ්ඨ එල්ටීටීඊ නායකත්වය ඝාතනය කල මැයි 18 වන දා අතරතුර කාලයේ දී සැබවින් ම දෛනික පදනමකින් ආන්ඩුව එල්ල කල ප්‍රහාර පිලිබඳ බියකරු ලැයිස්තුවක් වෙයි. ප්‍රහාරවලින් බොහොමයක් එල්ල කෙරුනේ රෝහල්වලට ය. එක ම ගොඩනැගිලිවලට යලි යලිත් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වීමෙන් එම ස්ථාන හිතාමතා ඉලක්ක කර ගත් බව ඇඟවේ.

වාර්තාව ශ්‍රී ලංකා හමුදාව අධිකරන නියෝගවලින් බැහැරව සිදු කල ඝාතන, ආන්ඩුවට හිතපක්ෂපාතී ඝාතක කල්ලි සිදු කල "අතුරුදන් කිරීම්" සහ එල්ටීටීඊ ප්‍රදේශයට ආහාර සහ වෛද්‍ය සැපයුම් යැවීම හිතාමතා අවහිර කිරීම පිලිබඳ සාක්ෂ්‍ය ද උපුටා දක්වයි. මිලිටරියේ එල්ලය වූයේ අවසන් ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා සූදානමක් වශයෙන් එල්ටීටීඊ පාලනය යටතේ පැවති ප්‍රදේශයෙන් සිවිල් ජනයා බුරුතු පිටින් පලවා හැරීම යි. එමෙන් ම වාර්තාව එල්ටීටීඊය ලමා සොල්දාදුවන් බඳවා ගත් සහ යුද මුක්ත

කලාපයෙන් සිවිල් ජනයා ඉවත් වී යාම වැලැක්වූ අවස්ථා ද ලැයිස්තුගත කරයි.

එහෙත්, මොන යම් හෝ සිදුවීමක පවතින සාපරාධී ස්වභාවය ගැන හෝ ඒවා සැබවින් ම සිදු වූයේ ද යන්න ගැන පවා හෝ තමන් කිසි ම නෛතික නිගමනයකට නොඑලඹෙන බව රාජ්‍ය දෙපාර්තමේන්තුව ප්‍රකාශ කරයි. ඒ අනුව එය හිතාමතා තමන්ගේ ම වාර්තාවට යටි වල කපයි. මෙම විරුද්ධවාචකවලින් අවධාරනය වන්නේ, ජනාධිපති මහින්ද රාජපක්ෂ, ඔහුගේ කැබිනට් මන්ඩලය සහ රටේ මිලිටරි නායකයන් ඇතුලු මෙම යුද අපරාධවලට වගකිව යුත්තන්ට එරෙහිව නඩු පැවරීමක් සඳහා බල කිරීමේ කිසිදු අභිප්‍රායක් වොෂින්ටනයට නැති බව යි.

අව්‍යාජ විමර්ශනයක් සිදු කල හොත්, එල්ටීටීඊය සමග ඇති කර ගත් 2002 සටන් විරාමය කඩ කිරීමේ දී සහ 2006 වසර මැද දිවයින යලි සිවිල් යුද්ධයෙහි ගිල්වා දැමීමේ දී රාජපක්ෂ ආන්ඩුවට නිහඬව සහාය දෙමින් එක්සත් ජනපදය ඉටු කල කාර්ය භාරය ගැන නො වැලැක්විය හැකි ලෙස ම ප්‍රශ්න මතු වනු ඇත. තව දුරටත් කිව හොත්, කොලඹ ආන්ඩුව තමන් යලි ආරම්භ කල වාර්ගික යුද්ධය "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්" යැයි යුක්ති සහගත කලේ වොෂින්ටනය අනුයමිනි. එමෙන් ම එය යොදා ගත්තේ ඉරාකයේ දී සහ ඇෆ්ඝනිස්ථානයේ දී එක්සත් ජනපද මිලිටරිය යොදා ගත් උපක්‍රම ම ය — සිවිල් වැසියන් ඉලක්ක කර ගනිමින් වග විභාගයක් නැතිව බෝම්බ හෙලීම, අත්තනෝමතික රඳවා තබා ගැනීම් සහ වධබන්ධන පැමිනවීම් ය.

මැයි මාසයෙහි පැවැත්වුනු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මන්ඩල රැස්වීමේ දී ශ්‍රී ලංකාවේ යුද අපරාධ සම්බන්ධයෙන් සීමිත ජාත්‍යන්තර පරීක්ෂනයක් කල යුතු බවට යුරෝපා බලවතුන් ඉදිරිපත් කල යෝජනාවට එක්සත් ජනපදය සහාය දුන්නේ ය. චීනයේ ද රුසියාවේ ද ඉන්දියාවේ ද සහායෙන් රාජපක්ෂ ආන්ඩුව එම යෝජනාව අවහිර කලේය. දැන් වොෂින්ටනය පරීක්ෂනයක් පවත්වන ලෙස කොලඹ ආන්ඩුවෙන් ඉල්ලා සිටින්නේ, එම ඉල්ලීමට එකඟ වුවත්, සිදු වන ඕනෑ ම විමර්ශනයක් සුදු හුනු ගෑමක් පමනක් වනු ඇති බව හොඳින් ම දැනුවත්ව ය.

මුල දී ශ්‍රී ලංකාන්ඩුව එක හෙලා ම මෙම වාර්තාව ප්‍රතික්ෂේප කලේ ය. එක්සත් ජනපද වාර්තාව "සනාථ නොකෙරුනක් සහ සනාථ කල සාක්ෂිවලින් තොර වූවක් බව පෙනී යතැ"යි ප්‍රකාශ කරමින් විදේශ අමාත්‍යාංශ ප්‍රකාශයක් ද වහාම නිකුත් විය. "තමන්ගේ ම මූල් බැසගත් අවශ්‍යතා සහිත කොටස්" "බෙදුම්වාදයේ ගිනිදැල්" මෙලවීමට "සහ ශ්‍රී ලංකාවේ ආන්ඩුවත් මහජනයාත් පුනරුත්ථාපනය සහ ජාතික සංහිඳියාව සඳහා දරන ඒකාබද්ධ ප්‍රයත්නයන් විනාශ කිරීමට" උත්සාහ කරමින් සිටින බව එය කියා සිටියේ ය.

මෙම ප්‍රකාශය වූකලි, පලත් සහා මැතිවරන මාලාවක් තුල දී, ජනාධිපති රාජපක්ෂ ඔහුගේ ආන්ඩුවේ අපරාධ වසන් කිරීම සඳහාත් ජාතිකවාදී මනෝගතිය උසි ගැන්වීම සඳහාත් ගසා කමින් සිටින ජාත්‍යන්තර කුමන්ත්‍රන න්‍යායේ පුනරාවර්තනයකි. ආන්ඩුව "පුනරුත්ථාපනය සහ ජාතික සංහිඳියාව" ඇති කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රයත්නයක යෙදී සිටින්නේ ය යන කියා පෑම විකාරයකි. මැයි මාසයේ පටන් දෙමල සිවිල් වැසියන් 250,000කට ආසන්න සංඛ්‍යාවක් ජරාජීර්න රැඳවුම් මධ්‍යස්ථාන තුල සිරගත කරනු ලැබ සිටින්නේ රටේ ව්‍යවස්ථාව ද නෛතික පද්ධතිය ද එලි පිට ම උල්ලංඝනය කරමිනි.

එක්සත් ජනපද සහ යුරෝපා බලවතුන්ට ශ්‍රී ලංකාව තුල "තමන්ගේ ම වූ මුල් බැසගත් අවශ්‍යතා" පවතින බව නිසැක ය. එහෙත් එල්ටීටීඊය යලි පන ගැන්වීම සමග හෝ දෙමල සුලුතරයේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කිරීම සමග ඊට කිසිදු සම්බන්ධයක් නැත. පෘථිවි ගෝලයේ අනෙක් කොටස්වල දී මෙන් ම මෙහි දී ද, එක්සත් ජනපදය සහ එහි මිත්‍ර පාක්ෂිකයෝ තම ප්‍රතිවාදීන්ගේ වියදමින් කොලඹ පාලනය තුල තමන්ට පවතින ආනුභාවය වැඩි කර ගැනීම සඳහා "මානව හිමිකම්" පිලිබඳ කරුන නරුම ලෙස ගසා කමින් සිටිති. දිවයින මත සැලකිය යුතු ආර්ථික සහ මූලෝපායික පාරුකුලක් තහවුරු කර ගැනීම සඳහා චීනය ශ්‍රී ලංකාන්ඩුවේ ආයුධ සහ මිලිටරිමය අවශ්‍යතා ගසා කෑවේ ය යන කරුන ගැන වොෂින්ටනය විශේෂයෙන් ම උත්සුක වී සිටී.

ඔක්තෝබර් 26 වන දා, රාජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රකාශය පිලිබඳ සිය පිලිවෙත ශ්‍රී ලංකාන්ඩුව යම් පමනකට වෙනස් කලේ ය. ප්‍රකාශයෙන් එල්ල කෙරෙන චෝදනා "පරෙස්සම් සහගතව විභාග කිරීම" සඳහා "විශේෂඥ කමිටුවක්" පත් කිරීමට එය එකඟ විය. මෙවැනි කමිටුවකින් කෙරෙන සොයා ගැනීම් පූර්ව-නිර්නිත නිගමනයකි. ශ්‍රී ලංකාව තුල ද ජාත්‍යන්තරව ද කෝපාග්නියේ ගිනි පුපුරු නංවා ඇති ඝාතන, "අතුරුදන් කිරීම්" සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් පිලිබඳ වෙනත් බරපතල අපචාරයන්ට සුදු හුනු ගෑම සඳහා කමිටු සහ කොමිසම් පත් කිරීම සම්බන්ධයෙන් රාජපක්ෂ කුප්‍රකට ය.

පැරිසිය මූලස්ථානය කොට ගත් ඇක්ෂන් කොන්ට්‍රෙ ලා ෆෙයිම් සංවිධානය සමග වැඩ කල ශ්‍රී ලාංකික කම්කරුවන් 17 දෙනෙකු මරන දඬුවම් පැමිනවීමේ ශෛලියෙන් ඝාතනය කිරීම ඇතුලු ප්‍රධාන ගනයේ මානව හිමිකම් උල්ලංඝනයන් පිලිබඳ සිද්ධීන් 16ක් විමර්ශනය කිරීමට 2006 නොවැම්බරයේ දී රාජපක්ෂ පත් කල ජාත්‍යන්තර විශේෂඥ කමිටුව එක්

උදාහරනයකි. විමර්ශනය "විනිවිද භාවයෙන් තොර" වූ බව ද "ජාත්‍යන්තර නියමයන්ට සහ ප්‍රමිතීන්ට අනුකූල නොවන" බව ද පවසමින් 2008 දී ජාත්‍යන්තර විශේෂඥයෝ ඉල්ලා අස් වූහ. ජූනි මාසයේ දී රාජපක්ෂ හිටි අඩියේ ම පරීක්ෂනය මුලුමනින් ම නවතා දැම්මේ ය.

ශ්‍රී ලංකාභ්‍යන්තර විමර්ශනයක් සඳහා කැඳවුම් කිරීමේ උපාය නිර්මානය කල ඔබාමා පාලනාධිකාරය මේ සියල්ල මැනවින් දනී. එය එම කැඳවුම කලේ යුද අපරාධ පිලිබඳ කරුන යට ගැසීමේත් රාජපක්ෂ ආන්ඩුව සමග සබඳකම් අලුත්වැඩියා කර ගැනීමට මග පාදා ගැනීමේත් මාධ්‍යයක් වශයෙනි. රාජපක්ෂ එකී යෝජනාව පිලිගැනීමෙන් පසුව, තවත් එ.ජ. ඩොලර් මිලියන 6.6ක ආධාර ලබා දෙන බව වොෂින්ටනය නිවේදනය කලේ ය. ඒ දෙමල සිවිල් වැසියන් සිරගත කරනු ලැබ සිටින ආන්ඩුවේ කඳවුරු පවත්වා ගෙන යාම සඳහා වන "සුභසාධන කටයුතු" වෙනුවෙන් දැනට මත් ලබා දී ඇති එ.ජ. ඩොලර් මිලියන 84ට අමතරව ය.

යුරෝපා බලවත්තු ද මීට සමාන උපාමාරුවක යෙදී ගෙන සිටිති. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව නිකුත් වූ ඔක්තෝබර් 22 වන දා ම, "250,000කට වැඩි ජනයා තව මත් රැඳවුම් කඳවුරුවල සිටීම ගැන ගැඹුරින්ම කනගාටුව පල කරමින්" යුරෝපා සංගම් පාර්ලිමේන්තුව යෝජනාවක් සම්මත කලේ ය. "එම රැඳවියන් ඉක්මනින් සිය ගම්බිම් කරා ආපසු යැවීමත් ඔවුන්ට හදිසි මානුෂීය සහාය ලබා දීමත් සංවිධානය කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගන්නා" ලෙස එය ශ්‍රී ලංකාන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය.

කොලඹ පාලනය සිය ඉල්ලීම්වලට එකඟ නොවන්නේ නම් ශ්‍රී ලංකාව වෙනුවෙන් ලබා දී ඇති "ජීඑස්පී ප්ලස් සහනය" නමින් හැඳින්වෙන අනුග්‍රහ පූර්වක වෙලඳ අයිතිවාසිකම ඉවත් කරන බවට යුරෝපා සංගමය තර්ජනය කරමින් සිටියි. මෙම "ජීඑස්පී ප්ලස් සහනය" ඉවත් කල හොත් මේ වන විට තීරු බදුවලින් නිදහස්ව යුරෝපා සංගමයට පිවිසෙන ශ්‍රී ලාංකික අපනයන භාන්ඩවලට සියයට 5 සිට 18 දක්වා වූ තීරු බද්දක් පැනවෙනු ඇත. සිය නිෂ්පාදනයෙන් සියයට 60කට ආසන්න ප්‍රමානයක් යුරෝපයට යවන ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ඉපැයුම්කරුවකු වන ඇඟලුම් කර්මාන්තයට ඉන් දැවැන්ත පහරක් වැදෙනු ඇත.

කොලඹ පාලනයට තර්ජනාංගුලිය එසවූ යුරෝපා සංගමය ප්‍රතිචාරයක් දැක්වීම සඳහා ශ්‍රී ලංකාවට නොවැම්බර් 6 වන දා තෙක් කල් ලබා දී තිබෙන අතර අවසන් තීරනයක් ගැනීම ඊලඟ ජනවාරි මාසයට කල් දමා ඇත. සබඳතා යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා සංවෘත සාකච්ඡාවල යෙදෙමින් තවත් මාස දෙකක් කල් මරන්නට යුරෝපා සංගමයටත් ශ්‍රී ලංකාවටත් ඉන් ඉඩ සැලසේ. මේ අතරවාරයේ, රැඳවුම් කඳවුරු තුල පවත්නා තැති ගන්වනසුලු කොන්දේසි යටතේ දෙමල සිවිල් වැසියෝ සියදහස් ගනනක් පීඩා විඳිමින් කල් ගෙවති.

© www.wsws.org